VERITÉ RESEARCH
Strategic Analysis for Asia

5 POLICE PARK PLACE, COLOMBO 05, SRI LANKA
TEL: + 94 112055544; FAX: +94 719379567
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

# නව ක්‍රමෝපායක් සඳහා දුවෙන ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය

වර්ෂ 2009 දී ශ්‍රී ලංකාවට පැමිණි විදේශ සංචාරකයන් සංඛ්‍යාව 447,000 ක් විය. 2010 වන විට මෙම සංඛ්‍යාව 654,000 දක්වා 50%ක වර්ධනයක් පෙන්වන ලදී. නැවත 2013 වන විට මෙම සංඛ්‍යාව දෙගුණයකට ආසන්න අංකයකට ලඟා වෙමින් මිලියන 1.3 ක පමණ අගයක් වාර්තා කරන ලදී. මේ අනුව දැනට පවතින අපේක්ෂාව වන්නේ 2013 අගය 2016 වන විට දෙගුණයක් වනු ඇති බවයි. නමුත් ශ්‍රී ලංකාව 2011-2013 කාලය තුළ මෙවැනි වර්ධනයක් කරා ගෙන ඒමට හේතු වූ සාධක 2014-2016 කාලය තුළ ද අපේක්ෂිත ඉලක්කය කරා ලඟා වීමට පිටුවහල් වන බවට අපේක්ෂා කළ නොහැකිය.

## සංචාරක කර්මාන්තය වර්ධනය සඳහා ඇති ඉඩකඩ


පසුගිය වර්ෂ කිහිපය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සුවිශේෂී වර්ධනයක් පෙන්වන ලදී. 2009 වර්ෂයේ යුද්ධය අවසන් වීමත් සමගම සංචාරකයන්ගේ පැමිණීම 40% වාර්ෂික වර්ධනයක් පෙන්වන ලදී. ආසියාව සහ පැසිෆික් කාලපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජයීය කොමිසම (UNESCAP) විසින් 2010-2011 කාලය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක පැමිණීමේ වර්ධනය 31% වන බවට දක්වන ලද අතර එය එම කාලය තුළ ගෝලීය වශයෙන් ද වාර්තා වූ ඉහලම වර්ධන අගය විය.

2013 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව මෙය රට තුළ පවතින සාමකාමී පරිසරයෙහි සහ උපායශීලී ආයෝජන සහ ප්‍රවර්ධන කටයුතු (සංචාරක කර්මාන්තයෙහි) වල ප්‍රතිඵලයකි. සංචාරක පැමිණීමේ වර්ධනයට අදාල දත්ත දෙස අවධානය යොමු කිරීමේදී මෙය පුරසාරම් කීමක් නොවන බවට පෙනී යන්නේ වර්තමානයේ 26.7% වන මෙම අගය ආසියානු පැසිෆික් කාලපයේ සාමාන්‍ය වර්ධන අගය මෙන් හතර ගුණයක් වන බැවිණි.

## ක්‍රමෝපායික විශ්ලේෂණය තුළින් කරුණු පිළිබඳ විශ්ලේෂනයක්

ලෝක ආර්ථික සංසදය (World Economic Forum) විසින් ඉදිරිපත් කරන සංචාර සහ චාරිකාවන් පිළිබඳ දර්ශකය (Travel and Tourism Index) රටක සංචාරක වර්ධනය සම්බන්ධව විධිමත් විශ්ලේෂණයක් සිදුකිරීම සඳහා යොදා ගත හැක. මෙමගින් ලෝකයේ විවිධ ආර්ථිකයින් සංචාර සහ චාරිකා සඳහා තම රටවල් තෝතැන්නක් කර ගැනීම සඳහා යොදා ගන්නා සාධක හා ප්‍රතිපත්ති පිළිබඳ තක්සේරුවක් ලබා දේ. ඒ අනුව ඉහලම ලකුණු ප්‍රමාණය ලබාගන්නා රට අංක 1 ස්ථානයේ ද අඩුම ලකුණු ප්‍රමාණය ලබා ගන්නා රට අංක 140 ස්ථානයේ ද සිටින ලෙස දර්ශකයේ ප්‍රතිඵල ඉදිරිපත් කෙරේ.


**රූප සටහන 01 - සංචාර සහ චාරිකාවන් පිළිබඳ දර්ශකය තුළ තරගකාරීත්වය**




මෙම දර්ශකය තුළ ශ්‍රී ලංකාවේ කාර්ය සාධකය දෙස අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ ශ්‍රී ලංකාව සංචාරක පැමිණීම සම්බන්ධව මෑත කාලයේදී ඉහළ වර්ධනයක් පෙන්වීමට බලපෑ ප්‍රධාන සාධකයක් වන්නේ ශ්‍රී ලංකාව සිය තරගකාරීත්වය වර්ධනය කර ගැනීම නොව ඊට පෙර කාලය තුළ අඩු සංචාරක පැමිණීමක් වාර්තා කොට තිබීමත් (එනම්, අඩු වර්ධන පදනමක්), යුද්ධය නිමාවීමත් යන කරුණු බවයි.


2009 යුද්ධය අවසන් වීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව 78 වන ස්ථානයේ සිට 74 වන ස්ථානය දක්වා මෙම දර්ශකය තුළ ප්‍රගතියක් පෙන්වන ලදී. ශ්‍රී ලංකාව ලබාගත් මෙම ප්‍රගතිය එතරම් ප්‍රශංසනීය නොවන්නේ අනෙකුත් තරගකාරී ආර්ථිකයන් දර්ශකය තුළ ඉහළ ප්‍රගතියක් අත් කර ගැනීමට සමත් වීම නිසාය. උදාහරණයක් ලෙස ඉන්දුනීසියාව ස්ථාන 11ක් හා වියට්නාමය ස්ථාන 8 ක් වශයෙන් ප්‍රගිතයක් වාර්තා කිරීමට සමත් විය. ශ්‍රී ලංකාව, මැලේසියාව හා තායිලන්තය මෙන් සංචාරක කර්මාන්තය තුළ තරගකාරීත්වය අතින් ඉහළ ස්ථානයකට පැමිණීමට අපේක්ෂා කරන්නේ නම් මෙම දර්ශකය තුළ ස්ථාන 30ක් පමණ ඉදිරියට පැමිණිය යුතුය (රූප සටහන 02).

රූප සටහන 02 - සංචාර සහ චාරිකාවන් පිළිබඳ දර්ශකය තුළ අනෙකුත් තරගකාරී ආර්ථිකයන්




මෙම විශ්ලේෂණය මගින් අවධානයට ගෙන එන තවත් කරුණක් වන්නේ ඒක පුද්ගල සංචාරක පැමිණීමයි (Tourist arrival per capita; එනම් ජනගහණයට සාපේක්ෂව සංචාරක පැමිණීමයි). 2009 දී පුද්ගලයින් 100 කට සංචාරකයින් 2.5 ක් පමණ වූ ඒක පුද්ගල සංචාරක පැමිණීම වර්තමානය වන විට 6.2ක අගයක් දක්වා ඉහළ ගොස් ඇත. නමුත් නැගෙනහිර ආසියානු රටවල ඒක පුද්ගල සංචාරක පැමිණීම මා සංසන්දනයේදී ශ්‍රී ලංකාව පසුවන්නේ (රූප සටහන 03) ඉතා පහළ මට්ටමකය.

**රූප සටහන 03 - සංචාරක පැමිණීම (ජනගහණයෙන් 100 කට)**




**සංචාරක කර්මාන්තයේ වර්ධනයට හේතු වූ සාධක වල ඵල හීන වන ලකුණු**

යුද්ධයේ නිමාවත් සමගම ශ්‍රී ලංකාවට සංචාරක කර්මාන්තය සඳහා ලබාගත හැකි වූ වරප්‍රසාද මේ වන විට නිමාවට පත් වී ඇත (මහ බැංකුව විසින් සාමකාමී පරිසරය ලෙස හඳුන්වන සාධකය). එමෙන්ම මහ බැංකුව විසින් උපායශ්‍රීලී ආයෝජන (ප්‍රධාන වශයේ නව හෝටල් ඉදිකිරීම හා නව කාමර ඉදිකිරීම) හා ප්‍රවර්ධන වැඩසටහන් ලෙස හඳුන්වන සාධක මේ වන විට ආර්ථික විද්‍යාඥයින් විසින් හීනවන ආන්තික ඵලදාව ලෙස හඳුන්වන සංකල්පයට මුහුණ පා ඇත. එනම් සෑම නව ප්‍රයත්නයක් මගින් ලැබෙන අමතර ප්‍රතිඵලයන් ක්‍රමයෙන් අඩු වන බවයි.

එමනිසා 2009 සිට මේ දක්වා සංචාරක වර්ධනය සඳහා හේතු වූ සාධකම 2013 සිට 2016 කාලය තුළ මිලියන 2.5 ක සංචාරක ආකර්ශනයක් ලබා ගැනීම සඳහා ද උපකාරී වනු ඇතැයි අපේක්ෂා කළ නොහැක. එම නිසා මෙම ඉලක්කය සැබෑ කරගැනීම සඳහා සංචාරක ක්ෂේත්‍රය තුළ තරගකාරීත්වය වැඩි වන නව ක්‍රමෝපායන් අනුගමනය කළ යුතු වේ. මේ සඳහා සංචාරක තරගකාරීත්වය පිළිබඳ දර්ශකය තුළින් ශ්‍රී ලංකාවට හොඳ ආරම්භයක් ලබාගත හැකි අවස්ථාවන් පිළිබඳව ඉඟියක් ලබා දේ (සංඛ්‍යා සටහන 01). 2009 හා 2013 අතර ශ්‍රී ලංකාව දර්ශකය තුළ ස්ථාන 04ක් ඉදිරියට ගෙන ඒම සඳහා ප්‍රධාන දායකත්වය සැපයූවේ පරිපාලනමය පරිසරය (Regulatory Environment), මානව සම්පත් (Human resources), සංස්කෘතික සම්පත් (Cultural resources) සහ ස්වභාවික සම්පත් (Natural resources) යන උප කාණ්ඩ 4හි සිදුවූ ප්‍රගතියයි.

පරිපාලනමය පරිසරය යන උප කාණ්ඩය තුළ ප්‍රගිතය සඳහා බලපෑ ප්‍රධාන සාධකය වූයේ එහි අනු කාණ්ඩයක් වන ත්‍රස්තවාදයේ ව්‍යාපාරික පිරිවැය යන ක්ෂේත්‍රය තුළ ස්ථාන 100ක පමණ ප්‍රගතියක් වාර්තා කිරීමට සමත් වීමයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ අවධානය දැන් යොමුවිය යුත්තේ දර්ශකය තුළ ඉතා අඩු ලකුණු මට්ටමක පවතින අනු කාණ්ඩ වර්ධනය කර ගැනීමටත් ලකුණු මට්ටම ක්ෂය වීමකට ලක්වී ඇති අනු කාණ්ඩ නැවත වැඩි කර ගැනීමේ ප්‍රවණතාවකට ගෙන ඒමට කටයුතු කිරීමටත්ය.

**දර්ශකය තුළ අඩු හා හීන වෙමින් පවතින කාර්ය සාධනයක් පෙන්වූ අංශ**

මෙම විශ්ලේෂණය මගින් පෙන්වා දෙන්නේ පාරිසරික තිරසාරත්වය, සංචාරක යටිතල පහසුකම්, තොරතුරු හා සන්නිවේදන යටිතල පහසුකම් සම්බන්ධව ශ්‍රී ලංකාව අඩු ලකුණු මට්ටමක සිට තවත් පසුගාමී තත්ත්වයකට පත්ව ඇති බවයි. පාරිසරික තිරසාරත්වය සම්බන්ධව පසුගාමී තත්ත්වයක් වාර්තා කිරීමට බලපෑ ප්‍රධාන කරුණ වන්නේ පාරිසරික රෙගුලාසි, පරිසර දූෂණය සහ පාරිසරික ගිවිසුම් යන අනු කාණ්ඩ තුළ ලබා ගත් ලකුණු ප්‍රමාණය අඩු වීමයි.

සංචාරක යටිතල පහසුකම් සම්බන්ධව සලකා බැලීමේදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර වන්නේ හෝටල් කාමර සංඛ්‍යාව, වාහන කුලියට දෙන ආයතන සංඛ්‍යාව සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව යනාදියයි. අවසාන වශයෙන් තොරතුරු හා සන්නිවේදන යටිතල පහසුකම් දෙසට අවධානය යොමු කිරීමේදී අධිවේගී අන්තර්ජාල පිවිසුම් පහසුකම්, අනතර්ජාල පහසුකම් සහිත පුද්ගලයින් සංඛ්‍යාව වැනි අංශ දෙසට අවධානය යොමු කිරීම වැදගත් වේ.

**දර්ශකය තුළ මධ්‍යම මට්ටමේ සිට හීන වෙමින් පවතින කාර්ය සාධනයක් පෙන්වූ අංශ**

මානව සම්පත් හා සංස්කෘතික සම්පත් මෙම අංශයට වැටේ. මානව සම්පත් සම්බන්ධව ලකුණු මට්ටම අඩු වීම සඳහා බලපෑ ප්‍රධාන සාධක 03ක් තිබේ. එනම්, පුහුණු ශ්‍රමිකයන්ගේ සැපයුම, වෘත්තිකයන් සඳහා බඳවා ගැනීම සහ ඉවත් කිරීමට ඇති ක්‍රමවේදය, විදේශ ශ්‍රමිකයන් බඳවා ගැනීමට ඇති පහසුව යන කරුණුය. සංස්කෘතික සම්පත් සම්බන්ධව ප්‍රගතියක් අත්කර ගැනීම සඳහා ලෝක සංස්කෘතික උරුම මධ්‍යස්ථාන ප්‍රමාණය වැඩිකර ගැනීම හා ජාත්‍යන්තර ප්‍රදර්ශන හා සල්පිල් වැඩිපුර පැවැත්වීම යන කරුණු වැදගත් වේ.

මෙම විශ්ලේෂණය මගින් ඉදිරිපත් කෙරෙන්නේ සරල විග්‍රහයකි. ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව 2010 සිට මේ වන විට දෙගුණයක් බවට පත් වී ඇත. ඊට බලපෑ ප්‍රධාන කරුණ වන්නේ යුද්ධය අවසන් වීම, හොටල් කාමර සංඛ්‍යාව වැඩිවීම සහ ප්‍රවර්ධන වැඩසටහන් යනාදියයි. නමුත් මේ වන විට මෙම සාධක කිහිපය හීනවන ආන්තික ඵලදාවයන්ට මුහුණ පා ඇත. ශ්‍රී ලංකාව 2016 වන විට සංචාරක පැමිණීම දෙගුණයක් කර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් නව ක්‍රමෝපායයන් වර්ධනය කිරීමට අවධානය යොමු විය යුතුය. ඒ සඳහා හොඳ ආරම්භයක් ලෙස සංචාරක තරගකාරීත්වය පිළිබඳ දර්ශකය තුළ කාර්යය සාධනය දෙසට අවධානය යොමුකොට ඒ තුළ පවතින ඉඩප්‍රස්ථාවන් අවබෝධ කරගත යුතුය. සංචාරක ක්ෂේත්‍රය තුළ සිදුවූ ප්‍රගතිය දීර්ඝකාලීන ලෙස පවත්වා ගෙන යැමට නම් එම ක්‍රමෝපායික වෙනස් කිරීම තවත් කාල පමාවකින් තොරව දැන්ම සිදුවිය යුතුය.

සංඛ්‍යා සටහන 01 :සංචාර සහ චාරිකාවන් පිළිබඳ දර්ශකය තුළ අනු කාණ්ඩ පිළිබඳ විශ්ලේෂණය

| අනු කාණ්ඩ තුළ ලබාගත් ශ්‍රේණිය | 2013 | 2011 | 2009 | 2009- '13 |
|---|---|---|---|---|
| අනු කාණ්ඩය A - සංචාරක හා චාරිකා නියාමනය සඳහා ඇති රාමුව | **61** | **79** | **86** | **25** |
| A 01 ප්‍රතිපත්තිමය රීති හා රෙගුලාසි | 62 | 91 | 68 | 6 |
| A 02 පාරිසරික තිරසාරත්වය | 119 | 117 | 112 | -7 |
| A 03 ආරක්‍ෂාව සුරක්‍ෂිත බව | 35 | 91 | 107 | 72 |
| A 04 සෞඛ්‍යය හා සනීපාරක්‍ෂාව | 83 | 81 | 90 | 7 |
| A 05 සංචාරක සහ චාරිකා සඳහා ප්‍රමුඛත්වය බලාදීම | 31 | 32 | 47 | 16 |
| අනු කාණ්ඩය B - ව්‍යාපාරික පරිසරය සහ යටිතල පහසුකම් | **86** | **83** | **73** | **-13** |
| B 06 ගුවන් ප්‍රවාහනය සඳහා ඇති යටිතල පහසුකම් | 88 | 90 | 87 | -1 |
| B 07 ගොඩබිම ප්‍රවාහනය සඳහා ඇති යටිතල පහසුකම් | 29 | 34 | 32 | 3 |
| B 08 සංචාරක යටිතල පහසුකම් | 108 | 104 | 92 | -16 |
| B 09 තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය සඳහා ඇති යටිතල පහසුකම් | 116 | 94 | 90 | -26 |
| B 10 මිල තරගකාරීත්වය | 34 | 60 | 28 | -6 |
| අනු කාණ්ඩය C - සංචාරක හා චාරිකා සඳහා ඇති මානව, සංස්කෘතික සහ ස්වභාවික සම්පත් | **66** | **68** | **71** | **5** |
| C 11 මානව සම්පත් | 78 | 54 | 49 | -29 |
| C 12 සංචාර හා චාරිකා සඳහා ඇති පිලිගැනීම | 51 | 99 | 65 | 14 |
| C 13 ස්වභාවික සම්පත් | 42 | 44 | 59 | 17 |
| C 14 සංස්කෘතික සම්පත් | 86 | 82 | 75 | -11 |

**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**

**ඔබගේ අදහස් insights@veriteresearch.org වෙත විද්‍යුත් තැපැල් මාර්ගයෙන් යොමු කරන්න.**